ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

තේ පර්යේෂණ මණ්ඩලය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ඇබෑර්තු

තලවකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන)

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය විද්‍යා ධාරාවෙන්, එක් වරකදී විෂයයන් තුනකින් (03) සමත් විය යුතු අතර, අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී, ගණිතය, විද්‍යාව හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම

සහ

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබාගත්, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 තලයට නොඅඩු, අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) ඩිප්ලෝමාවක්.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් - 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දින සිට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

02. තාක්ෂණවේද නිලධාරී (යාන්ත්‍රික)

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී, අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයයන් තුනකින් (03) සමත්වීම සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය, ගණිතය හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) විෂයන් ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව එක්වරකදී, විෂයයන් හයකින් (06) සමත්වීම සහ

ආ) අදාළ ක්ෂේත්‍රයේ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5/6 තලය, සහ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද.

අභ්‍යන්තර :

බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දින සිට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

03. තාක්ෂණවේද නිලධාරී (සිවිල්)

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී, අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයයන් තුනකින් (03) සමත්වීම සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය, ගණිතය හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) විෂයන්ද ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටීම. සහ

ආ) අදාළ ක්ෂේත්‍රයේ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5/6 තලය, සහ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද.

අභ්‍යන්තර :

බාහිර අයදුම්කරුවන්හට අවශ්‍ය සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දින සිට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

04. තාක්ෂණවේද නිලධාරී (උපයෝග) / යන්ත්‍රාගාර ක්‍රියාකරු

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී, අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය විද්‍යා ධාරාවේ විෂයයන් තුනකින් එක් වරකදී සමත්වීම සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරකදී , ගණිතය, විද්‍යාව හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) විෂයන් ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම. සහ

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ හා පිළිගත් තාක්ෂණ පුහුණු ආයතනයකින් නිකුත් කළ (NVQ 5) තලයට නොඅඩු බොයිලර් / යන්ත්‍රාගාර ක්‍රියාකරු ඩිප්ලෝමාවක් සමඟ

ඇ) ප්‍රධාන යන්ත්‍රාගාර මෙහෙයුම් කාර්ය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමෙන් පසු වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දින සිට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මඟින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

05. තාක්ෂණවේද නිලධාරී (වැඩහල)

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී, අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයයන් තුනකින් (03) සමත්වීම සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී, ගණිතය හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම. සහ

ආ) අදාළ ක්ෂේත්‍රයේ, ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5/6 තලය, සහ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්ද.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

06. ක්ෂේත්‍ර නිලධාරී

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී, අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, විද්‍යාව / කෘෂිකර්මය ධාරාවේ විෂයයන් තුනක් (03) එක් වරකදී හා අ.පො.ස. (සා/පෙළ) විභාගය, විද්‍යාව / කෘෂිකර්මය හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්ව සිටීම, සහ

ආ) NVQ 5 තලයට නොඅඩු, පිළිගත් ආයතනයකින් ලබාගත් වසර දෙකක (02) කෘෂිකර්ම ඩිප්ලෝමාවක්, සමග

ඇ) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක, සේවක අධීක්ෂණ / වගා පරිචයන් ආදිය පිළිබඳව වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

07. කළමනාකරණ සහකාර (ගබඩා පාලනය)

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය හා තාක්ෂණික කාර්ය සඳහා පහසුකම් සපයා, සහාය ලබාදී, අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණික ස්වභාවයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

බාහිර :

අ) අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයන් තුනකින් (03) සහ අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී ගණිතය හා භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටීම, සහ

ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් NVQ 5 තලයට නොඅඩු ගබඩා කළමනාකරණ (එක් වසරක කාලයකට වඩා වැඩි) ඩිප්ලෝමා සහතිකයක් සමඟ, ගබඩා පවත්වා ගැනීම හා තොග පාලන පද්ධති සම්බන්ධයෙන්, ගොඩනැගිලි ද්‍රව්‍ය, මෝටර් / විදුලිමය, රසායනාගාර උපකරණ හා රසායන ද්‍රව්‍ය පිළිබඳව කටයුතු කරනු ලබන රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

MA 2-2 (2016) රුපියල් 30,310 - 10x300 - 7x350 - 4x600 - 20x710 - රුපියල් 52,360/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 27,170/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 382/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

08. කළමනාකරණ සහකාර (ලඝු ලේඛනය)

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය සඳහා පහසුකම් සහාය හා අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණ නොවන ස්වභාවයේ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම දරයි.

බාහිර :

අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයන් තුනකින් (03) හා අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල හෝ දමිළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව, එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වීම, සහ

පරිගණක යෙදවුම් පිළිබඳ දැනුම (උදා. වර්ඩ් ප්‍රොසෙසිං, ස්ප්‍රෙඩ්ෂීට්, ඉදිරිපත් කිරීම හා ලඝු ලේඛනය)

සහ

පරිගණකය / යතුරු ලියනය භාවිත කරමින්, ඉංග්‍රීසි භාෂාවෙන් වදන් සැකසුම් වේගය, පිළිවෙලින් විනාඩියකට වචන 50/40 බැගින් විය යුතුය. සහ

සිංහල / ඉංග්‍රීසි ලඝු ලේඛණ වේගය විනාඩියකට වචන අවම වශයෙන් 80/70 විය යුතුය.

සටහන :

සිංහල හා දමිළ වදන් සැකසුම් පිළිබඳ දැනුම තිබීම විශේෂයෙන් වාසි සහගත වනු ඇත.

අභ්‍යන්තර :

අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව විෂයන් හතරක සම්මාන සහිතව විෂයන් හයකින් (06) සමත් වීම. සහ

"ප්‍රාථමික තලයේ" නුපුහුණු, අර්ධ පුහුණු හා පුහුණු වර්ගීකරණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සතුවීම. සහ

වදන් සැකසුම (විශේෂයෙන් වර්ඩ්, එක්සෙල් හා පවර් පොයින්ට්) පිළිබඳ දැනුම සහ පරිගණක වදන් සැකසුම් වේගය ඉංග්‍රීසි හා සිංහල මධ්‍යයෙන් , පිළිවෙලින් වචන 50 හා40 විය යුතුය. සහ

සිංහල / දෙමළ ලඝුලේඛන වේගය අවම වශයෙන් විනාඩියකට වචන 80/70 විය යුතුය.

සටහන :

සිංහල හා දෙමළ වදන් සැකසුම් දැනුම සතුවීම විශේෂයෙන් වාසි සහගත වනු ඇත.

වැටුප් පරිමාණය :

MA 1-2 (2016) රුපියල් - 27,910 - 10x300 - 7x350 - 12x600 - 12x710 - රුපියල් 49,080/- (මසකට)

මූලික වැටුප වන රුපියල් 27,910/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 25,018/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 1,200/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

09. ක්ෂේත්‍ර සුපර්වයිසර්

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය සඳහා පහසුකම් සහාය හා අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණ නොවන ස්වභාවයේ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම දරයි.

බාහිර :

අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විද්‍යාව/කෘෂිකර්මය ධාරාවේ විෂයන් තුනකින් (03) හා අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී, සිංහල හෝ දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව, විෂයයන් හයකින් (06) සමත්ව සිටීම, සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

සටහන :

දෙමළ හා ඉංග්‍රීසි භාෂාව කථන දැනුම සුවිශේෂ ලෙස වාසිදායක වනු ඇත.

අභ්‍යන්තර :

අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව විෂයන් හයකින් (06) සමත්ව තිබීම, සහ

"ප්‍රාථමික තලයේ" නුපුහුණු, අර්ධ නුපුහුණු හා පුහුණු වර්ගීකරණයේ ස්ථාවර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් වීම.

සටහන :

දෙමළ හා ඉංග්‍රීසි භාෂා කථන හැකියාව විශේෂිත ලෙස වාසිදායක වනු ඇත.

වැටුප් පරිමාණය :

MA 1-2 (2016) රුපියල් 27,910 - 10x300 - 7x350 - 12x600 - 12x710 - රුපියල් 49,080/- (මසකට)

2020.01.01 දිනට මූලික වැටුප වන රුපියල් 27,910/- වේ.

(2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 25,018/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 1,200/- වේ.)

වයස :

අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

10. පිළිගැනීමේ නිලධාරී / දුරකථන ක්‍රියාකරු

රැකියා විස්තරය :

ආයතනයේ කළමනාකරණ කාර්ය සඳහා පහසුකම් සහාය හා අතිරේක සේවා ලබාදීම සඳහා තාක්ෂණ නොවන ස්වභාවයේ ක්‍රියාකාරකම් ඉටුකිරීමේ වගකීම දරයි.

බාහිර :

අ.පො.ස. (උ/පෙළ) විභාගය, එක් වරකදී, විෂයන් තුනකින් (03) හා අ.පො.ස. (සා/පෙළ) විභාගය, සිංහල හෝ දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව සම්මාන හතරක් (04) සහිතව, එක් වරකදී, විෂයයන් හයකින් (06) සමත්වීම, සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

සටහන :

ඉංග්‍රීසි හා දෙමළ භාෂා කථන හැකියාව විශේෂයෙන් වාසිදායක වනු ඇත.

අභ්‍යන්තර :

අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව විෂයන් හතරකට (04) සම්මාන සහිතව විෂයන් හයකින් (06) සමත්වීම, සහ

"ප්‍රාථමික තලයේ" නුපුහුණු, අර්ධ පුහුණු හා පුහුණු වර්ගීකරණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සතුවීම.

සටහන :

ඉංග්‍රීසි හා දෙමළ භාෂා කථන හැකියාව විශේෂයෙන් වාසිදායක වනු ඇත.

වැටුප් පරිමාණය :

MA 1-2 (2016) රුපියල් 27,910 - 10x300 - 7x350 - 12x600 - 12x710 - රුපියල් 49,080/- (මසකට)

2020.01.01 දිනට මූලික වැටුප වන රුපියල් 27,910/- ගෙවනු ලැබේ.

(2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 25,018/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 1,200/- වේ.)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

11. රියදුරු

රැකියා විස්තරය :

ආයතනයේ මූලික ප්‍රවාහන පහසුකම් අවශ්‍යතා සැපයීමට අදාළ රාජකාරී කටයුතු අයත් වේ.

බාහිර :

අ.පො.ස. (සා/පෙළ) විභාගය, එක් වරකදී, ගණිතය හා භාෂාව (සිංහල හෝ දෙමළ) විෂයයන් හයකින් (06) සමත්වීම. සහ

බරවාහන පැදවීමේ වලංගු බලපත්‍රයක් සතුවීම හා රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ ආයතනයක බරවාහන පැදවීමේ අවම වසර පහක (05) පළපුරුද්ද.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම්.

වැටුප් පරිමාණය :

PL 3 (2016) රුපියල් 26,290 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රුපියල් 39,490/- (මසකට)

2020.01.01 දිනට මූලික වැටුප රුපියල් 26,290/- වේ.

(2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 23,566/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 1,755/- වේ)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරාගැනීමේ ක්‍රමවේදය :

වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

12. ආගන්තුක නිවස්න පාලක

රැකියා විස්තරය :

ආයතනයේ ආගන්තුක නිවස්නය (Guest House) ඉහළ තත්ත්වයෙන් පවත්වාගෙන යාමේ වගකීම දරන අතර, කළමනාකාරීත්වය විසින් අනුමත කළ පරිදි අමුත්තන්හට හා කාර්ය මණ්ඩලයට නවාතැන් පහසුකම් හා ආහාරපාන සැපයිය යුතුය.

බාහිර :

අ.පො.ස. (සා/පෙළ) විභාගය, ගණිතය හා භාෂාව (සිංහල හෝ දෙමළ) ඇතුළත්ව, එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වීම. සහ

NVQ 2/3 තලයට නොඅඩු, පිළිගත් සංවිධානයකින් ගෘහ පාලනය සම්බන්ධ සහතික පාඨමාලාවක් හදාරා තිබීම. සහ

ප්‍රසිද්ධ රජයේ හෝ වෙළඳ ආයතනයක, සංචාරක බංගලාවක / ආගන්තුක නිවස්න පාලක වශයෙන් අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද.

සටහන :

පෙරදිග / අපරදිග ආහාරපාන පිළියෙල කිරීමේ හා සංග්‍රහ කිරීමේ හැකියාව සතුවීම විශේෂිත වාසිදායක කරුණක් වේ.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන්හට නියමිත සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

PL 2 (2016) රුපියල් 25,750 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රුපියල් 38,950/- (මසකට)

2020.01.01 දිනට මූලික වැටුප රුපියල් 25,750/- ගෙවනු ලැබේ. (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 23,082/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 1,940/- වේ)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. ඉහත ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරාගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

13. නේවාසිකාගාර භාරකරු

රැකියා විස්තරය :

ආයතනයේ නේවාසිකාගාරය ඉහළ තත්ත්වයෙන් පවත්වා ගැනීම සහ කළමනාකාරීත්වය විසින් අනුමත කළ විට අදාළ අමුත්තන්හට හා කාර්ය මණ්ඩලයට අවශ්‍ය නවාතැන් පහසුකම් හා ආහාර පාන සැපයීම සම්බන්ධ වගකීම දරයි.

බාහිර :

අ.පො.ස. (සා/පෙළ) විභාගය, ගණිතය හා භාෂාව (සිංහල හෝ දෙමළ) ඇතුළත්ව, එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වීම. සහ

NVQ 2/3 තලයට නොඅඩු, පිළිගත් සංවිධානයකින් නිකුත් කළ ගෘහ පාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාවක් හදාරා තිබීම. සහ

ප්‍රසිද්ධ රජයේ හෝ වෙළඳ ආයතනයක, සංචාරක බංගලාවක / ආගන්තුක නිවස්න පාලක ලෙස අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද.

සටහන :

පෙරදිග / අපරදිග ආහාරපාන පිළියෙල කිරීමේ හා සංග්‍රහ කටයුතු හැකියාව විශේෂයෙන් වාසිදායක වේ.

අභ්‍යන්තර :

ඉහත බාහිර අයදුම්කරුවන්හට අවශ්‍ය සුදුසුකම් අදාළ වේ.

වැටුප් පරිමාණය :

PL 2 (2016) රුපියල් 25,750 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රුපියල් 38, 950/- (මසකට)

2020.01.01 දිනට මූලික වැටුප රුපියල් 25,750/- ගෙවනු ලැබේ. (2019.01.01 දිනට ආරම්භක වැටුප රුපියල් 23,082/- වන අතර, ගැලපුම් දීමනාව රුපියල් 1,940/- වේ)

වයස :

අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරාගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

වෙනත් ප්‍රතිලාභ :

i.) පවතින්නේ නම් නවාතැන් පහසුකම් ලබා දෙනු ලබන අතර, නැතහොත් ඒ සඳහා ගෙවීමක් සිදු කරනු ඇත.

ii.) ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයෙහි පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

iii.) ආයතනයේ මාර්ගෝපදේශ ප්‍රකාරව, හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලයේ ප්‍රවාහන පහසුකම් සපයේ.

iv.) සති අන්තයේ දිනවලදී, කොළඹ හා මහනුවර දක්වා, තලවාකැලේ ශාන්ත කූම්බ්ස් හි සිට ප්‍රවාහන පහසුකම් සපයේ.

v.) අර්ථසාධක අරමුදල : තෝරාගත් අයදුම්කරු විසින් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල සඳහා, තම වැටුපෙන් 10% දායකත්වයක් ලබාදිය යුතු අතර, ආයතනය ඒ සඳහා 15% දායකත්වයක් දරයි. එසේම, ආයතනය විසින් අමතර 3% දායකත්වයක් සේවක භාර අරමුදලට ලබාදේ.

vi.) පර්යේෂණ ආයතනයේ අනෙකුත් සේවකයන්හට අදාළ වෙනත් ආන්තික ප්‍රතිලාභද ගෙවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිරය. සියලු ජීව දත්ත හා අයදුම්කරු ගැන කරුණු සොයා බැලීමට අවශ්‍ය ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග උප්පැන්න සහතිකය, අදාළ අධ්‍යාපනික සුදුසුකම් හා අනෙකුත් වෘත්තීය සුදුසුකම්වල පිටපත් හා සේවා ලිපියක් / ලිපි සහිතව, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් අය වෙත **2019 ජූලි 01 වන දිනට** පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රජයේ සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු වේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන ලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත. එසේම, අදාළ **කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර** සඳහන් කරන්න.

වැඩිදුර තොරතුරු සඳහා, කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙන්න.

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.

Source: Silumina (2019.06.16)